**මහින්ද රාජපක්ෂ විද්‍යාලයය - හෝමාගම.**

**දෙවන වාර පරීක්ෂණය - 2011**

**සිංහල භාෂාව හා සාහිත්‍යය**

**6 ශ්‍රේණිය** **කාලය - පැය 2 යි**

නම/විභාග අංකය :........................................................................

## I කොටස

❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

❖ **වාක්‍යයේ හිස්තැනට සුදුසු වචනය තෝරා ලියන්න.**

1. අපේ රටට ....................................චිත්‍ර සම්ප්‍රදායක් පැරණි විහාර බිතු සිතුවම් අතර දක්නට ලැබේ.
   1) ආරෝපිත 2) ආකස්මික 3) ආවේණික 4) ගැලපෙන

2. මිනිස් ........................................ රජකරන නාගරික පරිසරය මිනිස් සිතේ නිසල බව සිඳලති.
   1) අසහනය 2) ශ්‍රවය 3) තදබදය 4) කලබලය

❖ **නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.**

3. 1) ප්‍රශ්න 2) වර්න 3) දර්ශණය 4) ප්‍රතිපල

4. 1) පරිඝනකය 2) කොට්ඨාසය 3) මර්ධනය 4) භාහිර

❖ **පහත සඳහන් පදවල සමානාර්ථ පද වරහන් තුළින් තෝරා ලියන්න.**

5. ධජ.......................................
6. අඳුර ....................................
7. අලස....................................
8. සුළඟ....................................

(පවන, අන්ධකාරය, කොඩි, උදාසීන )

❖ **පහත දැක්වෙන ක්‍රියාපදවලට ගැළපෙන විධික්‍රියා පද දෙක බැගින් ලියන්න.**

9. වඩියි 1..................................... 2........................................
10. පාඩම් කරයි 1..................................... 2........................................
11. නටයි 1..................................... 2........................................

❖ **පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.**

12. කටුස්සාගේ කරේ ....................................................

13. ගඟට ඉනි .............................................................

❖ **පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.**

14. සුබ..................................................

15. පසුදා...............................................

❖ **පහත දැක්වෙන වාක්‍යවලට සුදුසු ක්‍රියාපද වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.**

16. තරු අහස පුරා නැග .......................................(එයි/එති)

17. ඔවුහු ගී........................................ (ගැයුවෝ ය/ගැයුවේ ය.)

18. මම දත් මැද මුව සෝදා නින්දට ................................(ගියෙමු/ගියෙමි.)

❖ **පහත දැක්වෙන වාක්‍යයට ගැළපෙන විරාම ලකුණ යොදන්න.**

19) අයියේ ඔයා සෙල්ලම් කරන්න එනවා ද ..........................................................................................................

❖ **පහත සඳහන් වාක්‍ය ඛණ්ඩයෙහි නිපාත පද යටින් ඉරක් අඳින්න.**

20) අපේ ගෙය අලෙවි කිරීමට කඩේ මාමා කැඳවන්නේ අම්මා මෙන් ම තාත්තා ද තදින් විශ්වාස කළ අවුරුදු නැකතට සම්බන්ධ එවැනි කරුණු නිසා ය.

(ලකුණු 2 x 20 - 40)

## II පත්‍රය

❖ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

1) පන්ති ක්‍රියාකාරකමක් ලෙස ඔබ කණ්ඩාම් විසින් තොරතුරු සොයන ලද චරිත කතා ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ඔබ කණ්ඩායමට ජීවන තොරතුරු සෙවීම ට ලැබුණු චරිත කතාව කුමක් ද? (ලකුණු 2)

II. එම චරිතයට අදාළ තොරතුරු ලබාගත් ක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 4)

III. තොරතුරු සොයා ගැනීමේදී ඔබ මුහුණු පෑ ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 4)

IV. එම චරිත කතාව ඉදිරිපත් කිරීමේදී ඔබ ලබාගත් නිර්මාණශීලි හැකියා දෙකක් ලියන්න (ලකුණු 4)

V. එම චරිතයෙන් ඔබ ලබාගත් ආදර්ශය ලියන්න. (ලකුණු 2)

2) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

I. පොදු දේපළ සුරකිමු.

II. ජාතික උරුමයන් රැකගනිමු.

III. ජල සම්පත සුරකිමු.

IV. ගුරු දෙගුරු ඔවදන් පිළිපදිමු.

V. මා කැමති ජාතික වීරයා

VI. මුහුදු වෙරළේ අසිරිය

(ලකුණු 20)

3) ඔබ පාසලේ හෝ ප්‍රදේශයේ පැවැත්වෙන උත්සවයක් නැරඹීමට පැමිණෙන ලෙස දන්වමින් දුර පළාතක සිටින මිතුරකුට හෝ මිතුරියකට යවන ලිපියක් ලියන්න.

(ලකුණු 10)

4) පහත සඳහන් කවිය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අකුරට යනවයි කියලා
ටිකිරි අයිය බැදිවලමයි
ඉන්නකො මම ගුරු ගෙදරට
ගිහින් කියන්නම් - ගිහින් කියල
මේ බැද්දෙදි අල්ලල දෙන්නම්

I. "අකුරට යනවයි" යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? (ලකුණු 2)

II. "ගුරු ගෙදර" යනු කුමන ස්ථානයක් ද? (ලකුණු 2)

III. "බැදිවලමයි" යන්නට සමානාර්ථ පදයක් ලියන්න. (ලකුණු 1)

5) පහත සඳහන් පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a) "දළ උගුළන්නේ "කෙසේ ද ?

I. මෙම කොටස ඇතුළත් මුල් කෘතිය කුමක් ද ?

II. මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් විසින් ද ?

III. කා හට ද ?

"කොහෙන් ද ඒ හොරා පැන්නේ ? "

I. මෙම කොටස අයත් නාට්‍යයේ නම කුමක් ද ?

II.මෙම නාට්‍යයේ රචකයා කවුද?

III.මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් විසින් ද ?

" මාවී පඳුරේ ගස් අටක් තිබුණා "

I. මෙම කොටස ඇතුළත් පාඩමේ නම කුමක් ද?

II.එය උපුටා ගත් මුල් කෘතිය කුමක් ද?

III.මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින් ද ?

(ලකුණු 9)